# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 358/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 29/02/2024 පැය0800

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - වැලිපැන්න පොලිස් වසම.

2024.02.28 වන දින රාත්‍රී කාලයේදී වැලිපැන්න පොලිස් වසමේ පැලකැටියාගොඩ, හොරවල ප්‍රදේශයේදී පිහියකින් ඇන පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට වැලිපැන්න පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ පැලකැටියාගොඩ, හොරවල, වැලිපැන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වැත්තැව රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. පුද්ගලික ආරවුලක් හේතුවෙන් මෙම ඝාතනය සිදුකර ඇති බවට සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත. සැකකරුවන් හඳුනාගෙන ඇති අතර, අත්අඩංගුවට ගැනීම සඳහා වැලිපැන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. ජෙලටිනයිට්, ඩෙටනේටර් සහ සේවා නූල් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - මන්නාරම පොලිස් ස්ථානය.

2024.02.28 වන දින මන්නාරම පොලිස් වසමේ මන්නාරම කළු පාලම අසලදී මන්නාරම ගජබා නාවික හමුදා කඳවුරේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **ජෙලටි නයිට් කූරු 95 ක්, ඩෙටනේටර් 09 සහ සේවා නූල් 20 ක්** සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 03. මාරක රිය අනතුරක් - ගලේවෙල පොලිස් වසම.

2024.02.28 වන දින අළුයම් කාලයේ ගලේවෙල පොලිස් වසමේ අඹේපුස්ස ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ගයේ ලියනපොත ප්‍රදේශයේදී ගලේවෙල දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ ලොරි රථයක් ඉදිරියෙන් එම දිශාවටම ධාවනයවූ අත් ට්‍රැක්ටරයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ට්‍රැක්ටරයේ රියදුරු සහ තවත් පුද්ගලයෙකු බරපතල තුවාල ලබා ගලේවෙල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා දඹුල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 72 ක් වූ හීනුග්ගල, දේවහුය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ගලේවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**